**චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථාභාරය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය නොකළ මතය

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථාභාරයේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාභාරයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාභාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාභාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාභාරයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාභාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති රීති /විධිවිධාන වලට යොමුව | අනුකූල නොවීම | | |
| 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනත | | | |
| (i) 3.1 වගන්තිය | භාරයෙහි කළමනාකරණය සහ පාලනය සඳහා 2013 වර්ෂයේ සිට භාරකාර මණ්ඩලයක් පත්කර නොතිබුණි. | භාරකාර මණ්ඩලයක් පත් කර ගැනීම සම්බන්ධයෙන් දිගින් දිගටම රේඛීය අමාත්‍යාංශය සමඟ කටයුතු කර ඇත. | භාරයේ කළමනාකරණය සහ පාලනය සඳහා භාරකාර මණ්ඩලයක් පත් කළ යුතු වීම. |
| (ii) 11 වගන්තියේ 3 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සඳහා මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් මගින් බලය දෙන ලද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු අත්සන් කර ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික චිත්‍රපට සංස්ථා සභාපති සංස්ථා භාරයේද සභාපති වන හෙයින් සහ සංස්ථා සාමාන්‍යාධිකාරී භාරකාර මණ්ඩල කමිටු සාමාජිකයෙකු වන බැවින්ද ඔවුන් විසින් අත්සන් කරනු ලබන වාර්ෂික ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු අත්සන් කර ඉදිරිපත් කළ යුතු වීම. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) චිත්‍රපට කලාකරුවන්ට හා කාර්මිකයන්ට දායක විශ්‍රාම වැටුප් ක්‍රම සකස් කිරීම, ඉතිරි කිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම පිහිටුවීම, නිවාස පහසුකමක් හෝ වෙනත් සමාන ප්‍රතිලාභයක් පිරිනැමීම වැනි සංස්ථා භාරයේ ප්‍රධාන අරමුණු සඳහා මූල්‍ය සම්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික චිත්‍රපට සංස්ථාව අවධානය යොමු කර 2018 වසරෙහි කටයුතු කර ඇත. | භාරයේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා මූල්‍ය සම්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |
| (අ) චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා විශ්‍රාම වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 5,643,000 ක් ප්‍රදානය කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වනවිටත් භාරයේ කටයුතු සඳහා භාරකාර මණ්ඩලයක් පත් නොකිරීම නිසා ප්‍රතිලාභීන් වෙනුවෙන් ඉතිරිකිරීමේ අරමුදල් පිහිටුවීම, සකසුරුවම් සමිති ඇතිකිරීම, ණය ලබාදීම, නිවාස පහසුකම් ලබාදීමට අවධානය යොමු වී නොතිබුණි. | ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් ලබා ගැනීමෙන් අනතුරුව පොරොත්තු ලේඛන ගත සුදුසුකම්ලාභී චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන් වෙත නව විශ්‍රාම වැටුප් ගෙවීම ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. | ප්‍රතිලාභීන් වෙනුවෙන් ඉතිරිකිරීමේ අරමුදල් පිහිටුවීම සැකසුරුවම් සමිති ඇති කිරීම, ණය ලබාදීම, හා නිවාස පහසුකම් ලබාදීම කෙරෙහි අවධානය යොමු විය යුතුවීම. |

## 2.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ----------------------------- | --------------- |
| (අ) | භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර ප්‍රතිගැනුම් බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල 2018 වර්ෂය තුළදී භාරය විසින් රු.12,488,687 ක් ආයෝජනය කර තිබුණද වඩා වාසිදායක පොලී ප්‍රතිලාභ අත්වන ලෙස ආයෝජනය කර නොතිබුණි. | රාජ්‍ය බැංකු වෙතින් ලබා ගත් වැඩිම පොලී ප්‍රතිශත තොරතුරු මත වැඩිම පොලී ප්‍රතිශතයක් ලබා දීමට එකඟ වූ ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කරන ලදී. | ආයෝජන කිරීමේදී වඩා වාසිදායක පොලී/ ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | භාරයේ රීති මාලා අංක 3.3.5 අනුව වෙනත් ආකාරයකින් විශ්‍රාම ප්‍රතිලාභයක්, අර්ථ සාධක මුදලක් හෝ සහනාධාරයක් ලබයි නම් විශ්‍රාම ප්‍රතිලාභ ලැබීමට නුසුදුසු වුවත් භාරය විසින් විශ්‍රාම ප්‍රතිලාභ ගෙවනු ලබන කලාකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් එම රීතිය ප්‍රකාරව පරීක්ෂාවකට ලක්කර හෝ තොරතුරු රැස්කිරීමක් කර නොතිබුණි. | මියගිය විශ්‍රාම වැටුප් ලාභීන් සම්බන්ධයෙන් තොරතුරු පවතී. | ප්‍රතිලාභ ලැබීමට සුදුසු ප්‍රතිලාභීන් හඳුනාගත යුතු වීම. |
| (ඇ) | භාරය මගින් ලබාදෙන ප්‍රතිලාභ පිළිබඳව කලාකරුවන් හා කාර්මිකයින් දැනුවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබීම නිසා නව ප්‍රතිලාභීන් අරමුදලට දායක කර ගැනීමට නොහැකි වී තිබුණි. | සුදුසුකම් ලාභීන් සම්බන්ධයෙන් ගොනු ගත විස්තර ප්‍රමාණවත් නොවීම / වෙනස් වීම තුළ මෙය සිදුව ඇත. | නව ප්‍රතිලාභීන් අරමුදලට දායක කර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වීම. |